# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1971/23 - 2016 ජුනි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2016.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 02/2016

**1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 ජුනි මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

---

**1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනත**

ආඥාව

1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2016 ජුනි මස 17 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයේ 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 ජුනි මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 2984— 507 (2016/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| ශීර්ෂ අංක (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරු බදු ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකක (6) |
| 15.11 | | | ශුද්ධ කළ හෝ නොකළ, නමුත් රසායනිකව නවීකරණය නොකළ පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | | | |
| | 1511.10 | - | ශුද්ධ නොකළ තෙල් | (PK) නිදහස් | 30%හෝ කි. ග්‍රෑමයට රු. 66/- | කි. ග්‍රෑ. |
| | 1511.90 | - | අනෙකුත් : | | | |
| | 1511.90.10 | --- | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්) | | 30%හෝ කි. ග්‍රෑමයට රු. 66/- | කි. ග්‍රෑ. |
| | 1511.90.20 | --- | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | | 30%හෝ කි. ග්‍රෑමයට රු. 72/- | කි. ග්‍රෑ. |
| | 1511.90.30 | --- | ශුද්ධ නොකළ පාම් ඔලේන් | | 30%හෝ කි. ග්‍රෑමයට රු. 66/- | කි. ග්‍රෑ. |
| | 1511.90.90 | --- | අනෙකුත් | | 30%හෝ කි. ග්‍රෑමයට රු. 72/- | කි. ග්‍රෑ. |

07-247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.